# මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

# වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය (TNSWSP)

# රැකියා පුරප්පාඩු නිවේදනය

දේශසීමා මායිම් ආශ්‍රිත වෙළඳ කටයුතු නියාමනය කිරීමේ නියෝජිතායතන වෙත වෙළඳුන් විසින් දේශසීමා මායිම් හරහා සිදුවන සිය වෙළඳ ප්‍රවාහයන් (ආනයන, අපනයන හා ප්‍රතිනැව්ගත කිරීම්) පිළිබඳ ලේඛන හා දත්ත අවශ්‍යතා ඉදිරිපත් කිරීම සඳහා තනි ප්‍රවේශ කේන්ද්‍රයක් වශයෙන් වෙළඳ ජාතික තනි කවුළු පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් තීරණය කර තිබේ. එවැනි ක්‍රියාවලියක ප්‍රතිඵල ද අයදුම්කරුවන් වෙත ස්වයංක්‍රීය වෙළඳ ජාතික තනි කවුළුවක් හරහා දැන්විය යුතුය.

ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් යෝජිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එකී කාර්යය උදෙසාම වූ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයක් (PIU) ස්ථාපනය කිරීමට තීරණය කර තිබේ. එබැවින්, 2024 දෙවන කාර්තුව තුළ ක්‍රියාත්මක වීමට නියමිත වෙළඳ ජාතික තනි කවුළු පද්ධති ව්‍යාපෘතියේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ පහත සඳහන් තනතුරු සඳහා වඩාත්ම සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කර තිබේ.

**සුදුසුකම්**

## 1) ව්‍යාපෘති අධ්‍යක්ෂ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආර්ථික විද්‍යාව හෝ ජාත්‍යන්තර වෙළඳාම හෝ රාජ්‍ය පරිපාලනය හෝ රාජ්‍ය ප්‍රතිපත්තිය හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධිය; **හෝ**
- අදාළ ක්ෂේත්‍රය පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සමාන සුදුසුකමක්;
- පිළිගත් ආයතනයකින් ලබාගත් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රයක් වඩාත් පිළිගැනේ; **සහ**
- ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර 12ක පළපුරුද්ද (ශ්‍රී ලංකාවේ රජයේ ආයතනයක් තුළ ඍජු පළපුරුද්ද වඩාත් පිළිගැනේ) සහ එයින් අවම වශයෙන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය;
- සම්බන්ධීකරණයකින් යුතු/ අන්තර් නියෝජිතායතන ක්‍රියාවලි කළමනාකරණය සමඟ කටයුතු කිරීමේ නිපුණතාවය හා පළපුරුද්ද වඩාත් පිළිගැනේ.

## 2) තොරතුරු තාක්ෂණ විශේෂඥ - I

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ මෘදුකාංග ඉංජිනේරු හෝ අදාළ ක්ෂේත්‍රයක මූලික උපාධියක්; **හෝ**
- අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්;
- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් වඩාත් පිළිගැනේ;
- පිළිගත් ආයතනයකින් ලබාගත් ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සහතික පත්‍රයක් වඩාත් පිළිගැනේ; **සහ**
- මහා පරිමාණ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධතිවලට අදාළව අවම වශයෙන් වසර 09ක පළපුරුද්ද, සහ එයින් අවම වශයෙන් වසර 04ක් කළමනාකරණ මට්ටමේ විය යුතුය.

## 3) සමායෝජිත දේශසීමා මායිම් ක්‍රියාවලි කළමනාකරණ විශේෂඥ

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආර්ථික විද්‍යාව හෝ ව්‍යාපාර හෝ රාජ්‍ය පරිපාලනය හෝ ජාත්‍යන්තර වෙළඳාම හෝ රාජ්‍ය ප්‍රතිපත්ති, හෝ අදාළ ක්ෂේත්‍රයක මූලික උපාධියක්; **හෝ**
- අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්;
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් වඩාත් පිළිගැනේ; **සහ**
- දේශසීමා මායිම් ක්‍රියාවලි කළමනාකරණ කටයුතුවලට අදාළව අවම වශයෙන් වසර 08 ක පළපුරුද්ද හා එයින් අවම වශයෙන් වසර 04 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතු ය; **හෝ**
- 1 වන ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද සමග රජයේ දීප ව්‍යාප්ත සේවාවක 1 වන ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයක එවැනි සමාන තනතුරක් දරන්නෙකු වීම.

## 4) තොරතුරු තාක්ෂණ විශේෂඥ - II

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ මෘදුකාංග ඉංජිනේරු හෝ අදාළ ක්ෂේත්‍රයක මූලික උපාධියක්; **හෝ**
- අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්;
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් වඩාත් පිළිගැනේ; **සහ**
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පද්ධති සකස් කිරීමේ කටයුතු වලට අදාළව අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

## 5) නීති හා නියාමන කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ නිලධාරී

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන නීතිය පිළිබඳ මූලික උපාධිය; **හෝ**
- අදාළ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්;
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් වඩාත් පිළිගැනේ; සහ
- ජාත්‍යන්තර වෙළඳ නීතිය හා ප්‍රතිපත්ති, රේගු හෝ දේශසීමා ප්‍රතිපත්ති, රජයේ නෛතික ක්‍රියාමාර්ග, සහ/හෝ ප්‍රතිපත්ති අවදානම් විශ්ලේෂණයට අදාළව අවම වශයෙන් වසර 05ක පළපුරුද්ද; **සහ**
- ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වීම.

**පොදු කොන්දේසි**

- 2024.03.25 වන දිනට වයස අවුරුදු 63 නොඉක්මවිය යුතු ය.
- වාර්ෂික කාර්යසාධන ඇගයුම මත පදනම්ව වාර්ෂිකව කොන්ත්‍රාත්තුව දීර්ඝ කිරීමට යටත්ව, මාස 36ක කාලසීමාවක් සඳහා අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගනු ලැබේ.
- 2024.03.25 වන දිනට හෝ ඊට පෙර අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරාලිය යුතුය.
- පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් සතුය.
- මෙහි සඳහන් නොවන හෝ බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ පැන නගින යම් ගැටලුවක් සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් හා එකම තීරණය වේ.
- වැටුප සම්බන්ධයෙන් සාකච්ඡා කර එකඟතාවයකට එළඹිය හැකි අතර අනෙකුත් ප්‍රතිලාභ 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 විධිවිධාන පරිදි හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

අධ්‍යාපනික/ වෘත්තිය සුදුසුකම් පිළිබඳ සහතික, සේවා පළපුරුද්ද, සහ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත් සහ ඥාතීන් නොවන තමා පිළිබඳ විස්තර ලබාගත හැකි පුද්ගලයන් දෙදෙනෙකු සම්බන්ධ කරගත හැකි දුරකතන අංක සමගින් විස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන් විසින් 2024.03.25 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැල/ අතින් ගෙනවිත් බාරදීම යන මාර්ග ඔස්සේ පහත ලිපිනයට ලැබෙන ලෙසට එවිය යුතුය. අයදුම්පත සමග අනෙකුත් ලේඛන අන්තර්ගත ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**ලිපිනය :**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව,**
**මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය, මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.**

කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර ජීව දත්ත පත්‍රිකාව සමග අදාළ සියලු ලේඛන අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කිරීම නොසුදුසු වීම සඳහා හේතුවක් වනු ඇත.

තනතුරු පිළිබඳ කෙටි විස්තරයක් ද ඇතුළුව වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර මෙම වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. http://www.treasury.gov.lk/news

**ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය,**
**මහ ලේකම් කාර්යාලය, කොළඹ 01.**
**දිනය: 2024.03.10**